15

# ගෝරා නවකතාවෙන් හෙළි වන නූතනත්වයේ හා සම්ප්‍රදායේ මත ගැටුම පිළිබඳ විමර්ශනයක්.

*දම්මිකා කුමාරි, ජී.* [1]

දහනව වැනි සියවස අග හා විසි වැනි සියවසේ මුල් භාගය වන විට භාරතීය සමාජය වටා ගොඩනැඟී තිබූ සමාජ, දේශපාලනික, සංස්කෘතික පසුබිම තත්ත්වාකාරයෙන් රූපණය වූ නවකතාවන් අතුරින් රවින්ද්‍රනාථ ඨාකූර් විසින් විරචිත "ගෝරා" නවකතාව ප්‍රමුඛස්ථානයෙහි ලා සැලකේ. නූතන ඉන්දියාවේ බුද්ධිමය නවෝදයක් ඇති වූ යුගයක බිහි වූ "ගෝරා" නවකතාවෙන්, යටත්විජිත පාලන සමයේ ඉන්දීය සමාජයේ පැවති සම්ප්‍රදාය හා නූතනත්වය අතර ප්‍රතිවිරෝධී ආකල්ප ඝට්ටනය නිරූපණය කිරීමට යත්න දරා ඇත. "ගෝරා" නවකතාව සහ ඒ පිළිබඳ ලියවුණු වෙනත් විචාර කෘති ද්විතීයික මූලාශ්‍රය ලෙස ගෙන කතුවරයා උක්ත නවකතාවෙන් සාම්ප්‍රදායික සමාජය හා නූතනත්වය අතර ඇති වූ ඝට්ටනය නිරූපණය කළ ආකාරය විමසුමට ලක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. තත් යුගයේ ඇති වූ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරවල ප්‍රතිඵල ලෙස ආර්ය සමාජ්, බ්‍රහ්ම සමාජ් ආදි සංවිධාන හඳුනාගත හැකි ය. ඨාකූර්ට ද එම සමාජ පදනම නවකතාව ලිවීමෙහි ලා උපකාරී වී ඇත. ජාතිකත්ව සංකල්පය ගොඩනැඟීමත් සමඟ ම සමාජ සංස්ථාහි පැවති සමාජ ප්‍රගතියට බාධා පමුණුවන ආචීර්ණ කල්පික මතවාද මෙන් ම නූතන අදහස් ඝට්ටනය වීම නොවැළැක්විය හැකි බැව් මෙහි දී විශද වේ. එහි දී පුහු මතවාද, චාරිත්‍රවලට වඩා මානව හිතවාදීත්වය සමාජය ඉක්මවා නැඟී සිටීමක් සිදු වන බව කතුවරයා අවසානයේ සමස්තාර්ථය තුළින් කලාත්මක ව ප්‍රතිනිර්මාණය කිරීමට සමත් ය. 'සියලු භෞතික ගැටීම් පසෙක ලා මිනිසා, මිනිසා වෙනුවෙන් කටයුතු කිරීම අගනේ ය' යන සදාතනික සත්‍යය මෙහි දී "ගෝරා" නවකතාවෙන් ප්‍රතීයමාන වීම එය උසස් නවකතාවක් බවට පත් කරයි.

ප්‍රමුඛ පදඃ ගෝරා, ඨාකූර්, සම්ප්‍රදාය, නූතනත්වය, ඝට්ටනය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* gdkumari.gamage@gmail.com